# විඥානවාදයේ ප්‍රභවය හා මූලික ඉගැන්වීම් පිළිබඳ විමර්ශනයක්

තාවකාලික කථිකාචාර්ය පූජ්‍ය පනාමුරේ චන්දිම හිමි

වාදයක් යනු යම් සංකල්පයක් හෝ කාරණයක් සම්බන්ධයෙන් එය ම සත්‍යයයි. එයම නිවැරදියි, එයම ප්‍රබල වේ ආදී ලෙසින් දැඩිව අන්තවාදීව කටයුතු කිරීමයි. ඒ අනුව විඥානවාදය යනු විඥානවාදයම සත්‍ය වේ. ස්ථිර වේ. සදාකාලික වේ. එයම ප්‍රබල වේ යනුවෙන් ප්‍රකාශ කරන වාදයයි. බාහිර ලෝකය පිළිබඳ ඉන්ද්‍රිය සංඥානයට හසුවන අරමුණු යනු අන් කවරක් හෝ නොව සිතුවිලිවලින්ම සමන්විත ඒවාය, යන්න මෙම විඥානවාදයේ ප්‍රධාන පිළිගැනීමයි.

සම්බුද්ධ ශාසනයේ චිරකල් පැවැත් ම වෙනුවෙන් සිදුකරන ලද ධර්ම සංගායනාවන්හි ප්‍රතිඵලයක් ලෙසට භික්ෂු සංස්ථාව දෙකඩ විය. පසුව එය අටළොස් නිකායක් දක්වා වර්ධනය විය. එහෙත් වසර ගණනාවකට පසු නිකාය වශයෙන් නොව සම්ප්‍රදාය වශයෙන් පිළිගත් මතිමතාන්තර හතරක් විය. හියුං සියෑං ආදී චීන යාත්‍රික තෙරවරු ද ජපන් බෞද්ධ පඬිවරු ද එම අදහස සනාථ කර ඇත. එනම්,

1. සර්වාස්තිවාදී සම්ප්‍රදාය

---

"විමලසර", අතිපූජ්‍ය උඩුපිහිල්ලේ විමලබුද්ධි ස්වාමීන්ද්‍ර අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්. ශාස්ත්‍රවේදී පූජ්‍ය දන්කන්දේ සීලරතන හිමි, 2017.

2. සෞත්‍රාන්තික සම්ප්‍රදාය
3. මාධ්‍යමික සම්ප්‍රදාය
4. යෝගාචාර සම්ප්‍රදාය වශයෙනි.

සර්වාස්තිවාදීන්ගේ "සර්වං අස්ති" සියල්ල ඇත යන වාදයත්, මාධ්‍යමිකයන්ගේ "සර්වේ ධර්මා ශූන්‍යතා ලක්ෂණඃ" සියල්ල ශූන්‍යය යන වාදයත් ප්‍රතික්ෂේප කරමින් එම වාද දෙකෙහි ඌණ පූර්ණයක් වශයෙන් හෝ නිවැරදි කිරීමක් වශයෙන් විඥානවාදය බිහිවිය. ඔවුන්ගේ අදහස වන්නේ විඥානය පමණක් විද්‍යමාන වන බවත් බාහිර ලෝකය අවිද්‍යමාන වන බවත්ය.[1]

දේශනාවක් ලෙස සම්භාවනීයත්වයෙන් සලකන සමස්ත මහායාන ධර්මයෙහි සාරය අන්තර්ගත යැයි විශ්වාස කෙරෙන සූත්‍රයක් වන ලංකාවතාර සූත්‍රයෙහි ඇතැම් කොටස් දාර්ශනික වශයෙන් වැඩි දියුණු කිරීමෙන් යෝගාචාරීන්ගේ විඥානවාදය පහළ වී යැයි සලකනු ලැබෙයි.[2]

දීර්ඝ කාලයක් තිස්සේ වනගතව යෝගාභ්‍යාසයන්හි නිරතව අති සූක්ෂම ලෙස මිනිස් සිත පිළිබඳ විමර්ශනයෙහි නියුක්තව සිටි යෝගීහු තමන් අවබෝධ කළ සත්‍යය දාර්ශනික සිද්ධාන්තයක් වශයෙන් විඥානවාදය බිහි කළ බව කියවෙයි.

සර්වාස්තිවාදීන් සියල්ල ඇතැයි පිළිගනියි. ඔවුන්ට විඥානය මෙන් ම විඥප්තිය ද ඇත. මාධ්‍යමිකයෝ සියල්ල ශූන්‍ය යැයි සලකති. ඔවුනට අනුව විඥානය මෙන්ම විඥප්තිය ද ශූන්‍යයය. සියල්ල ශූන්‍යයය. පරමාර්ථ වශයෙන් (සත්) විද්‍යමාන යයි ගතහැකි කිසිත් නැත. විඥානවාදී යෝගාචාරීන් මෙම අදහස් දෙකම ප්‍රතික්ෂේප කරති. ඔවුනට අනුව විඥානය පරමාර්ථ වශයෙන් විද්‍යමානය.[3]

බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කර ඇති යම් යම් ධර්ම කරුණු ද විඥානවාදයේ ප්‍රභවයට හේතු වී ඇති අයුරු අවබෝධ කරගත හැකිය. එවැනි නිදසුන් කිහිපයක් මෙසේය.

"විඤ්ඤානං අනිදස්සනං අනන්තං සබ්බතොපබං එත්ථ ආපොච තෙජොච පඨවීච න ගධති"[4]

මජ්ඣිම නිකායේ බ්‍රහ්මනිමන්තනික සූත්‍රයේදී මෙවැනි විස්තරයක් වෙයි.

"විඤ්ඤාණං අනිදස්සනං අනත්තං සබ්බතො පභං, පඨවිත්තෙන අන්නභූතං ආපස්ස ආපත්තෙන අන්නභූතං තෙජස්ස තෙජත්තෙන අන්නුභූතං"[5]

ධම්මපදයේ ආරම්භක ගාථාද්වය තුළින්ම දක්නට ලැබෙන්නේ මනසට ලබා දී ඇති මූලිකත්වයයි.

"මනො පුබ්බංගමා ධම්මා, මනො සෙට්ඨා මනොමයා"[6]

තවත් අවස්ථාවකදී මුළු ලෝකයම සිත මගින් පාලනය වන බව පෙන්වා දී ඇත.

"චිත්තෙන නීයති ලොකො චිත්තෙන පරිකස්සති."[7]

"විඤ්ඤාණංචහි ආනන්ද මාතුකුච්ඡිං න ඔක්කමිස්සථ"[8]

විඥානය මව්කුසට බැස නොගන්නේ නම් යනුවෙන් දක්වා ඇත්තේ ද විඥානය මූලික වන බවයි.

"විඤ්ඤාණං අනිදස්සනං - අනත්තං සබ්බතො පභං"[9]

විඥානය අනත්තය සෑම අතකින්ම දිප්තිමත්ය. මෙම ලක්ෂණයන් ද විඥානවාදී අදහස් කෙරෙහි උපකාරි වී ඇති ආකාරය අවබෝධ කරගත හැකිය. මේ සියලු උද්ධෘතයන් වලින් දක්වා ඇත්තේ විඥානය සියල්ලකටම මූලික වන බවයි.

එසේම මුල් බුදු සමය තුළ පුද්ගලයා පිළිබඳ කර ඇති විශ්ලේෂණය විඥානවාදයකට අත වැනීමක් යැයි සිතිය හැකිය. පුද්ගල සංකල්පය ප්‍රතික්ෂේප කරන බුදුසමය එය තහවුරු කිරීම උදෙසා ස්කන්ධ, ධාතු, ආයතන, වශයෙන් විශ්ලේෂණ ඉදිරිපත්

කරයි. පුද්ගලයෙකු නැත. ඇත්තේ පුද්ගලයකු පිළිබඳ සංකල්පයක් පමණි.

"යථාහි අංග සම්භාරා
හොති සද්දො රථො ඉති
එවං ඛන්ධෙසු සත්තෙසු
හොති සත්තොති සම්මුති"[10]

රූපය පිළිබඳ විග්‍රහයේදී ද සතර මහා භූත උපාදාය රූප ආදී විග්‍රහ ඇතුළත් ය. සම්මුති පරමාර්ථ වශයෙන් සත්‍යයන් දෙකක් ඉදිරිපත් කිරීම තුළ විඤ්ඤාණවාදය කෙරෙහි අවධානය යොමු වූවා විය හැකිය.

එසේම බුදුරජාණන් වහන්සේ ධරමාන සමයේදී ම විඤ්ඤාණවාදී දෘෂ්ටි පැවති බවට සාධක තිබේ. මහා තණ්හා සංඛ්‍ය සූත්‍රය තුළ දී සාති භික්ෂුවගේ මතය බුදුරදුන් ප්‍රතික්ෂේප කළහ. බුදුරදුන් එහි දී විඤ්ඤාණය ප්‍රතීත්‍ය සමුත්පන්න බව පෙන්වා දුන්හ.

"අනෙක පරියායෙන පටිච්ච සමුප්පන්නං විඤ්ඤාණං වුත්තං මයා"[11]

විඥානවාදය බිහිවීමට හේතු වූ තවත් සුවිශේෂී ධර්ම කරුණක් ලෙස ඒ ඒ සම්ප්‍රදායයන් අතර පැවති දැඩි තරගකාරීත්වය පෙන්වාදිය හැකිය. විශේෂයෙන් සෞත්‍රාන්තිකයන් සර්වාස්තිවාදයට එරෙහිව දර්ශනයක් ගොඩනගා ගන්නා ලදී. එනම් යෝගාචාර විඥාන වාදයයි. ඒ අනුව මුල් බුදුසමයේ ඇතුළත් කරුණු විඥානවාදය ගොඩනැගීමට හේතු වූ බව සිතිය හැකිය.

සර්වාස්තිවාදීන් බාහිර ලෝකයේ පැවැත්ම උත්පාද, ඨිති, භංග යන ත්‍රිවිධ අවස්ථාවන්ගෙන් "ඨිති" යන අවස්ථාවට මූලිකත්වය දුන්හ. එනම් එහි පැවැත්මක් දැකගත හැකි බවයි.

එහෙත් සෞත්‍රාන්තිකයන්ගේ අදහස වූයේ "ථිති" ලෙස අවස්ථාවක් නොමැති බවත් එය පිළිගත නොහැකි බවත්ය. එනම් සියල්ලක්ම ක්ෂණයක්ක්ෂණයක්පාසා වෙනස්වීමට ලක්වන හෙයින් පැවැත්මක "ථිති" තත්වයක් දක්නට නොමැති බවයි. එමෙන් ම සංකල්ප දෙකෙහි අවසන් ප්‍රතිඵලය වූයේ විඥානවාදී දර්ශනය බිහිවීමයි.

ලෝකය හා සත්ත්වයා පිළිබඳ මූල තත්වය කුමක් ද යන්න විඥානවාදීන්ගේ අවධානයට යොමුවී ඇත. මෙම මූලිකත්වය ආත්ම, බ්‍රහ්ම, ඊශ්වර හෝ විඥාන වැනි කිසියම් අලෞකික තත්වයක් ලෙස සිතති. ඔව්හු විඥානවාදීන් ලෙස අතීතයේ සිටම හඳුන්වා ඇත.

තවද විඥාන හා භෞතිකය සලකා ගෙන ගොඩ නැගෙන යම් චින්තනයක් වෙයි නම් එය විඥානවාදය ලෙස සරලව අර්ථ දැක්විය හැකිය.

මහායාන බෞද්ධ සම්ප්‍රදායයන් අතර ඉතාම පසුකාලීනව ආරම්භ වී ඇත්තේ විඥානවාදී යෝගාචාර සම්ප්‍රදයයි. එය බුද්ධ පරිනිර්වානයෙන් සියවස් අටකට පමණ පසුව ආරම්භ වූ බව යමකාමී නම් ජපන් පඬිවරයා පවසයි.[12] මෙම සම්ප්‍රදායේ ආදි කර්තෘ ලෙස සැලකෙන්නේ අසංග නම් ආචාරපාදයන් වහන්සේය. ඉතා තීක්ෂණ බුද්ධියකින් හෙබි අසංග පාදයන්ට "වසුබන්ධු" "විරංචිවත්ස" යන නම්වලින් හඳුන්වන සොහොයුරන් දෙදෙනෙක්ද වූහ. මෙම සම්ප්‍රදාය ක්‍රි.ව. හතරවන ශතවර්ෂය දක්වා කාලය තුළ නාමමාත්‍රික වශයෙන් පැවතුණි. සිව්වන සියවසේ දී පහළ වු අසංග, වසුබන්ධු යන ශ්‍රේෂ්ඨ පඬිවරුන්ගේ උසස් රචනා නිසා අති ප්‍රබල වූත් චිර ප්‍රසිද්ධ වුවත් දර්ශනයක් බවට පත්විය.

යෝගාචාර විඥානවාදී සම්ප්‍රදාය වෙනුවෙන් උනන්දුව ක්‍රියා කළ පශ්චාද් කාලීන ආචාරවරුන් අතර

ආචාර්ය දින්නාග
ආචාර්ය ධර්ම කීර්ති
ආචාර්ය ශාන්තරක්ෂිත
ආචාර්ය කමලශීල

යන ආචාර්යවරු ප්‍රමුඛ වෙයි. විඥාන වාදය මහායන සම්ප්‍රදායට අයත් වුව ද වර්තමානයේ අර්ථ නිරූපණය කරන මහායානයට එය අන්තර්ගත නොවන බව සඳහන් කළ යුතුය. දාර්ශනික ලෙසින් විඥාන සම්ප්‍රදායට අයත් වුව ද වර්තමානයේ අර්ථනිරූපණය කරන මහායානයට එය අන්තර්ගත නොවන බව සඳහන් කළ යුතුය. දාර්ශනික ලෙසින් විඥාන වාදය හා ශූන්‍යතාවාදය වෙත යම් පුද්ගලයකු විමර්ශනශීලීව අවධානය යොමු කරන්නේ නම් ඔහු මුල් බුදු දහමේ පරම සත්‍ය වෙතම නැඹුරුවනු නියතය. එමගින් බහුශ්‍රැත බව මෙන්ම විචක්ෂණශීලී බව ද ඇති වෙයි.

විඥානවාදි සම්ප්‍රදායේ අගය කියා පාන විවිධාකාරයේ ග්‍රන්ථ සමූහයක් වෙයි. ඒ අතර,

- විඥප්ති මාත්‍රතා විංශතිකාව
- විඥප්තිමාත්‍රතා ත්‍රිංශතිකාව
- යෝගාචාර භූමි ශාස්ත්‍රය
- ආර්ය ලංකාවතාර සූත්‍රය[13]

ආදිය ප්‍රධාන වෙයි. මෙම ග්‍රන්ථ සියල්ලෙහි ම පාහේ අන්තර්ගත වී ඇත්තේ විඥානයේ පැවැත් ම හා එහි ස්වභාවයයි. සම්බුද්ධ දේශනාව තුළ ඇති විඥානයට සම්බද්ධ ධර්ම මාතෘකාවන් තුළ යථාර්ථාවබෝධයට අදාළ ධර්ම කරුණු ඇතුළත් වී තිබේය යන්න විඥානවාදි ආචාර්යවරුන්ගේ අදහසයි.[14] එම නිසාම ඔව්හු බුද්ධ භාෂිතයෙහි යථාර්ථ සත්‍යය විඥානවාදී දෘෂ්ටිකෝණයෙන් විග්‍රහ කිරීමට අන් අයට දැඩි උනන්දුවක් දක්වා ඇත. එම උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස විඥානය යනු පරිණාමී ස්‍රෝතයක් ලෙස හඳුන්වා දුන්හ. එනම් විඥානය අඛණ්ඩව අවිච්ඡින්නව අතරක් නැතිව ගලා බස්නා ජල ප්‍රවාහයක් ලෙස විග්‍රහ කිරීමයි.

විඥානවාදය දාර්ශනික මාතවාදයක් ලෙස තහවුරු කරන ලද්දේ ආචාර්ය අසංග හා ආචාර්ය වසුබන්ධු යන හිමිවරුන් විසිනි. ඔව්හු තමන්ගේ දාර්ශනික මතවාදය සනාථ කරන ලද්දේ මේ ආකාරයෙනි.

"විඥානය පමණක් ඇතැයි පිළිගත්තවුන් විඥානවාදීහු වෙති. ඔව්හු සියල්ල ඇත. "සර්වං අස්ති යන සර්වාස්තිවාදී දෘෂ්ටිය බැහැර කරමින් අන් කිසිවක් නොව ඇත්තේ විඥප්ති මාත්‍රයක්ය යන්න ඉදිරිපත් කළහ. යෝගයත් ආචරයත් පිළිගත් බැවින් ඔවුහු යෝගාචාරවාදීහු විය. යෝගාචාරවාදයට අනුව නියම යෝගියාට යෝග බලයෙන් ප්‍රත්‍යක්ෂ දැනුමක් ලබාගත හැකි යයි ද ඔව්හු පැවසූහ."[15]

මේ ආකාරයට විඥානවාදය එම ආචාරවරුන් විසින් ම වර්ණනා කර තිබුණ ද විවිධ ප්‍රතිවිරුද්ධ අදහස් දැරූ සම්ප්‍රදායයන්ගේ දැඩි විවේචනයට ද ඔවුහු ලක් වූ බව පැවසිය යුතුය.

ලංකාවතාර සූත්‍රයේ දක්වා ඇති ආකාරයට විඥානවාදයේ විකාශනය සිදු වූ ආකාරය මෙසේ දැක්විය හැකිය.

"අථ ඛලු මහාමතිර් බෝධිසත්වො මහාසත්වඃ පුනරපි භගවන්තං එතද්අවොචත් කතිවිධො භගවත් විඥානානං උපපාදස්මිතිනිරෝධො භවති"[16]

මින් විග්‍රහ වන්නේ මහාමති බෝසත් තෙමේ නැවතත් භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "භාග්‍යවතුන් වහන්ස, විඥානයන්ගේ ඉපදීම පැවැත්ම හා නිරෝධය කවරාකාරයද? භාග්‍යවතුන් වහන්සේ ඊට මෙසේ පැවසූහ.

"ද්විධා මහාමතේ විඥානානං උත්පත්තිස්ථාන නිරොධො භවති. නච තාර්කිකො අවබුද්ධචින්තෙ ද්විවිධ උප්පාදො විඥානනං."[17]

මහාමතිය විඥානයන්ගේ ඉපදීම, පැවැත්ම හා නිරෝධය දෙපරිදිය. මේ බව තාර්කිකයෝ නොදනිති. දෙයාකාර වූ ඉපදීම කවරේද යත් ප්‍රබන්ධ උත්පත්තිය හා ලක්ෂණ උප්පත්තියයි. දෙයාකාර වූ පැවැත්ම කවරේද යත් ප්‍රබන්ධ ස්ථිතිය හා ලක්ෂණ ස්ථිතියයි. දෙයාකාර වූ නිරෝධය නම් ප්‍රබන්ධ නිරෝධය හා ලක්ෂණ නිරෝධයයි.

මෙහිදී ප්‍රබන්ධ හා ලක්ෂණ වශයෙන් දෙයාකාරයකින් විඥානයන්ගේ හට ගැන්මත් පැවැත්මත් නිරෝධයත් සිදුවන අයුරු උගන්වා ඇත. විඥානයන්ගේ මේ පරිණාමය තම තමන්ගේ අන්තර් ඥානයෙන් ම අවබෝධ කරගත යුතු බව බුදුරදුන්ගේ අනුශාසනය බව ලංකාවතාර සූත්‍රයේ සඳහන් වෙයි.

බුදුරජාණන් වහන්සේ විසින් විඥානයේ පැවැත්ම "ආශ්‍රයෙන්'' හා "ආලම්බනයෙන්" යන දෙයාකාරයෙන් පැහැදිලි කරති. විඥානයේ පැවැත් ම "ආශ්‍රය වන්නේ අකුසල කර්ම විපාක හා කුසල කර්ම විපාක ශක්තිය පිළිබඳවයි. බොහෝ කාලයක පටන් අතීත ආත්ම භවයන්හි දී රැස් කරන ලද අකුසල කර්ම විපාක බලයෙන් ද කුසල කර්ම විපාක බලයෙන් ද ඇසුර ලබමින් විඥානයන්ගේ පැවැත් ම සිදු වෙයි.

එසේම විඥානයන්ගේ පැවැත්මට ලැබෙන ආලම්බනය හෙවත් ස්වචිත්ත දෘශ්‍ය විඥාන විෂයෙහි ඇති විකල්ප බුද්ධියයි. මේ විකල්ප බුද්ධිය සියලු දෙනා තුළ ඇතිවන අතර එහි එල්බ ගැනීම නිසාද විඥානයන්ගේ පැවැත්ම සිදු වෙයි.

යෝගාචාර විඥානවාදී සම්ප්‍රදාය තුළ දක්නට ලැබෙන ඉගැන්වීම් අතර ත්‍රිවිධ විඥානය ප්‍රධාන වෙයි.

1. ප්‍රවෘත්ති විඥානය
2. මනන විඥානය
3. ආලය විඥානය[18] වශයෙනි.

මේ අතර ප්‍රවෘත්ති විඥානය ලෙස හඳුන්වනු ලබන්නේ එදිනෙදා ජීවිතයේ දී ක්‍රියාත්මක වන මානසික ක්‍රියාකාරිත්වයයි. ආලම්බන විඥානය ලෙස ද හඳුන්වනු ලබන්නේ එයයි. ඉන්ද්‍රියයන් හා අරමුණු එක්වීමෙන් උපදින චිත්ත පරම්පරාව මෙහි දී උගන්වා ඇත. එහි ප්‍රභේද හයක් වෙයි. එනම් චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මන වශයෙනි. ආනුභූතික ප්‍රකාශන සඳහා අදාළ වන්නේ ද මෙම ප්‍රවෘත්ති විඥානයයි. ආලය විඥානය හා මනන විඥානය යන ද්වයම ආනුභවික නොවේ. සියලු ප්‍රායෝගික අරමුණු සඳහා හේතු වන්නේ ද විශ්වය සිරස්ථාපනය වන්නේ ද ප්‍රවෘත්ති විඥානය මගිනි. ඉන්ද්‍රියයන්ගේ දායකත්වය ඒ සඳහා වැදගත් වන බව අවධාරණය කොට ඇත. ඒ අනුව සබ්බචිත්ත සාධාරණ, නියත කුසලයන්හි ද උපක්ලේශයන්හි ද ප්‍රවෘත්ති විඥානය යෙදෙයි.

මමත්වය සමග දැඩිව බැඳීගත් ගුප්ත මානසික ක්‍රියාකාරීත්වය මනන විඥානය ලෙස සලකයි. නූතන මනෝවිද්‍යාවේ යටි සිත ලෙස සලකනු ලබන්නේ මෙම මනන විඥානයයි. මෙය සප්තම විඥානය ලෙස සලකනු ලබයි. ප්‍රවෘත්ති විඥානය හා ආලය විඥානය අතර පවතින්නක් ලෙස ද සැලකෙයි. සියලු සිත්වල යෙදෙන සබ්බ චිත්ත සාධාරණ චෛතසිකයන් මනන විඥානය තුළ යෙදෙයි. එනම් ස්පර්ශ, වේදනා, සංඥා චේතනා මනසිකාර යන චෛතසිකයන්ය. තව ද මමත්වය ඇසුරු කරගත් චෛතසික ලෙස සැලකෙන ආත්ම දෘෂ්ටි, ආත්ම මෝහ, ආත්ම මාන, ආත්ම ස්නේහ යනාදිය මනන විඥානයෙහි යෙදෙයි.[19]

මනන විඥානය සෑම විටම "ක්ලිෂ්ට" යන උපපදය සමග යෙදෙයි. මෙම විඥානය බොහෝ විට ක්ලේශයන් සමග එක්ව පැවතීම එයට හේතුවයි. "නිවෘත" අව්‍යාකෘතක යනුවෙන් හඳුන්වනු ලබන ක්ලේශ දෙකක් මෙම විඥානය සමග යෙදෙයි. අනුභූති උත්තර විඥානයක් ලෙස මනන විඥානය සැලකෙයි. ථේරවාද සම්ප්‍රදායේ එන නීවරණ, ධර්මයන්ට මනන විඥානය සමාන කොට දක්වා ඇත. මනන විඥානයේ කාර්ය සෙසු

විඥානයන්හි රැස් වී ඇති ශක්‍යතා බලවත් කිරීමයි. මනෝ විඥානය ස්වාධීන මනෝ විඥානයක් නොවන බව මෙහිදී උගන්වා ඇත.

ත්‍රිවිධ විඥාන අතරින් ප්‍රධාන ම විඥානය ආලය විඥානයයි. විඥානවාදීන් මෙය අතිශය ගැඹුරු මෙන් ම මූලික සිද්ධාන්තයක් ලෙස සලකයි. මෙම විඥානය පුද්ගලයා විසින් කරනු ලබන කුසල වූ හෝ අකුසල වූ හෝ කර්මඵල වාසනා ශක්තිය රඳවා තබන ස්ථානය ලෙස හැඳින්වේ. ආලය විඥානය යනු නිරතුරුව ගලා බස්නා විඥාන ගංගාවකි. එය නිතර වෙනස් වෙමින් ගමන් කරයි. සංසාරයෙහි නැවත නැවත ඉපදීමට හේතුව එයයි. මෙම මතය හින්දූන්ගේ ආත්මවාදයට සමාන වුවත් ඔවුන්ගේ ආත්මය කිසි විටෙකත් වෙනස් නොවී පවත්නා අතර විඥානවාදීන්ගේ ආලය විඥානය නිරතුරුව වෙනස් වෙයි.[20]

විඥානවාදීන්ගේ අදහස වන්නේ ආලය විඥානය කර්ම රැස් කරන ගබඩාවකට සමාන බවයි. සත්වයාගේ සාංසාරික පැවැත්ම පිළිබඳ මූලික වගකීම දරන්නා ආලය විඥානය බව ඔවුන් පවසයි. එය විපාක විඥානය ලෙස ද පැවසෙයි. විඥානවාදීන් තම මතය තහවුරු කිරීමට උපකාරි කරගත් මූලධර්මයක් ලෙස ආලය විඥානය සැලකිය හැකිය.

ආචාර්ය අසංගපාදයන් විසින් ඉදිරිපත් කර ඇති සංකල්පයකි, ආලය විඥානය. එය චිත්ත, මනස්, විඥාන යන පදවලින් විග්‍රහ වේ. එහි චිත්ත යනු ආලය විඥානයයි. ස්කන්ධ, ධාතු ආයතනයන්ගේ සියලු සංවේදනයන් පිළිබඳ මූල බීජයන් එහි ඒකරාශීව පවතියි. මනස් යනු ආලය විඥානයේ අරමුණයි. එය නිරතුරුව ම අස්මි මානය හා ආත්ම දෘෂ්ටි, ආත්ම ඡන්ද යන ක්ලේශ සමග පවතී. විඥාන යනු ඉන්ද්‍රිය හය සමග සම්බන්ධ වන චක්ඛුවිඥාන ආදී ඉන්ද්‍රිය හයයි. මෙම ආලය විඥානයේ ලක්ෂණ මුල් බුදු සමය තුළ ද දැකිය හැකිය. එම ලක්ෂණ ම සංවර්ධනය කරගෙන ඒවා විග්‍රහ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්

"ආලය විඥානය" සංකල්පය ප්‍රභවය වී ඇතැයි සැලකිය හැකිය. ආලය විඥානය ඉතා පුළුල් ලෙස විග්‍රහ කර ඇත්තේ ලංකාවතාර සූත්‍රයේය.

ආලය විඥානය මහා සමුද්‍රයට සමානය. වායු වේගයෙන් හටගන්නා රළ පතර එහි නිතරම උස් පහත් වෙමින් පවතී. එහි නැවතීමක් කිසි දිනෙක නැත. එසේම විෂය ස්වරූපී වායු වේගයෙන් විඥාන ස්වරූපී තරංගයෝ (ආලය විඥාන) සමුද්‍රයෙහි හටගනිති. එහි කිසි දවසක නැවතීමක් නැත.[21] තවද "ආලය විඥානය පිළිබඳ අදහස් මුල් බුදුසමයේ සිට පැවති බව ඔවුන්ගේ අදහසයි.

"ආලය රාමා ඛො පනායං පජා ආලය රතා ආලය සමුදිතා"[22]

මෙම ප්‍රකාශය එයට සාක්ෂි ලෙස ඉදිරිපත් කරයි.

යෝගාචාර විඥානවාදී දර්ශනය හඳුනා ගැනීමට නම් මූලික ධර්ම සිද්ධාන්ත හතරක් වෙයි. එනම්,

1. පංච ධර්ම
2. ස්වභාව
3. අෂ්ට විඥාන
4. නෛරාත්මද්වය

මෙම ස්වභාව හතර අවබෝධ කර ගැනීමෙන් සමස්ත විඥානවාදී සම්ප්‍රදාය අවබෝධ කරගත හැකිය. චිත්ත, මනෝ, විඤ්ඤාණ, යන නම්වලින් සිත පිළිබඳ පරිනාමී තත්ත්වයක් නිරූපණය කිරීමට ඔවුන් කොතෙකුත් උත්සාහ කළත් උපකිලිෂ්ට චිත්ත හෙවත් කිලිටි සහිත සිත සහ අනුපක්ලික්ට චිත්ත හෙවත් නොකිලිටි ප්‍රභාෂ්වර ප්‍රකෘති සිත යැයි මූලික දෙයාකාර තත්ත්වයක් පෙළ දහමෙහි ස්ථාවරව පැවති බව පෙන්වා දිය හැකිය. ආගන්තුකව පැමිණෙන උපක්ලේෂයන්ගෙන් කිලිටි

වීමේදී එය මනස හෙවත් මනෝ විඥානය ලෙසින් ද නොකිලිටිව පවත්නා කල්හි එම තත්වය නිර්වාණය නමින් ද සලකයි.

තවද විඥානය හා බැඳෙන ඊට අදාළ වන කරුණු පහක් පිළිබඳ දක්වා ඇත. එනම්,

1. නාම
2. නිමිත්ත
3. විකල්ප
4. සම්‍යග්ඥාන
5. තථාගත අවබෝධය

මෙමගින් නිගමනය කෙරෙන්නේ සම්‍යග්ඥානය ලැබීමෙන් පසු තථාගත අවබෝධය ලැබෙන අතර විඥානය තුළින් යථාර්ථාවබෝධය ලැබෙන බවයි. එය විඥානවාදී යෝගාචාරීන්ගේ ආවසානික ඉගැන්වීම ලෙස සැලකෙයි. විඥානවාදයේ ප්‍රභවය හා මූලික ඉගැන්වීම් ඉහත සඳහන් ආකාරයෙන් විග්‍රහ වී ඇති ආකාරය අවබෝධ කරගත හැකිය.

**ආන්තික සටහන්**

1 මේධානන්ද හිමි, දේවාලේගම, චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය හැඳින්වීම, 100 පිටුව.

2 එම.

3 එම.

4 ඛුද්දක නිකාය, උදාන පාලි, 270 පිටුව, ත්‍රි.බු.ජ.මු.

5 මජ්ඣිම නිකාය, බ්‍රහ්මනිමන්තනික සූත්‍රය I, 670 පිටුව, ත්‍රි.බු.ජ.මු.

6 ධම්මපද පාළි, යමක වග්ගය, 1, 2 ගාථා.

7 සංයුත්ත නිකාය චිත්ත සූත්‍රය, I, 72 පිටුව, ත්‍රි.බු.ජ.මු.

8 සුමනපාල ගල්මංගොඩ, ආදි බෞද්ධ දර්ශනය මූලධර්ම විග්‍රහයක්, 205 පිටුව.

9 එම, 206 පිටුව.

10 සංයුත්තනිකාය, වජිරා සූත්‍රය, I, 72 පිටුව, ත්‍රි.බු.ජ.මු.

11 මජ්ඣිම නිකාය I, මහා තණ්හා සංඛය සූත්‍රය, 606 පිටුව, ත්‍රි.බු.ජ.මු.

12 එස්.ඒ.ජී. විජේසිංහ, යෝගාචාර විඥානවාදී මහායාන දර්ශනය, 14 පිටුව.

13 එම, 1 පිටුව.

14 එම.

15 එම, 2 පිටුව.

16 එස්.ඒ.ජී. විජේසිංහ, යෝගාචාර විඥානවාදී මහායාන දර්ශනය, 14 පිටුව.

17 එම.

18 මොරටුවේ සාසනරතන හිමි, ලක්දිව මහායාන අදහස්, 310 පිටුව.

19 දේවාලේගම මේධානන්ද හිමි, චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය හැඳින්වීමක්, 103 පිටුව.

20 පොල්වත්තේ බුද්ධදත්ත හිමි, ථෙරවාද බෞද්ධ දර්ශනය, 41 පිටුව, රත්න පොත් ප්‍රකාශකයෝ, මරදාන.

21 ලංකාවතාර සූත්‍රය, 2. 66 පිටුව.

22 මජ්ඣිම නිකාය, I, අරියපරියේසන සූත්‍රය, 570 පිටුව, ත්‍රි.බු.ජ.මු.